# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2052/7 - 2018 ජනවාරි මස 02 වැනි අඟහරුවාදා - 2018.01.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ සංශෝධිත දැන්වීමයි

*මගේ අංකය:* 3/6/2016/5.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2016/එච්ඩබ්ලිව්/82.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපොල ඕතොට කෝරළේ බටහිර සුළු කොට්ඨාසයේ අංක 912 කොරදොළුව ග්‍රාම නිලධාරි වසමට අයත් වැවල සහ කොරදොළුව ගම්වල පිහිටි ස්ර්වේයර් ජනරාල්ගේ අංක මූ. පි. අ. කු 2357 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබලි.

01. කැබලි අංක 40
ඉඩමේ නම: -; විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0163.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 පෙබරවාරි මස 22 වැනි දින පෙ.ව. 10.00ට පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද 2018 පෙබරවාරි මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
පොල්ගහවෙල.

2017 නොවැම්බර් මස 29 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

01-443


1A - G 26878 - 14 (2018/01)
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.